සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

### 11 - ශ්‍රේණිය

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I,II

කාලය: පැය 03යි.

නම/විභාග අංකය :- ........................................................... අමතර කියවීම් කාලය විනාඩි 10යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුකත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**<u>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I</u>**

සැලකිය යුතු ය.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර හෝ තෝරන්න.
- ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- වැඩිදුර විස්තර සඳහා පිළිතුරු පත්‍රයෙහි පිටුපස බලන්න.

<u>1 කොටස</u>

1. දත්ත හා තොරතුරු සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ/ය වන්නේ,

   **A.** දත්ත, අමුද්‍රව්‍ය මට්ටමේ පවතින දෙයක් ලෙස සලකනු ලැබේ.

   **B.** තොරතුරු සකස් කර දත්ත ලබාගත හැකිය.

   **C.** තොරතුරක වටිනාකම කාලය ගතවීමත් සමග වැඩි වේ.

   1). **A** පමණි. 2). **A** සහ **B** පමණි. 3). **B** සහ **C** පමණි. 4). **A, B** සහ **C** පමණි.

2. ක්ෂුද්‍ර සකසනයක් මගින් පාලිත සුහුරු ශීතකරණයකින් එහි ඇති ආහාර ද්‍රව්‍ය තොග පිළිබඳ පණිවුඩ, ශීතකරණය විවෘත නොකර ජංගම දුරකථනයට හෝ වෙනත් සුහුරු දර්ශන තලයකට ලබා ගත හැකිය. මෙහිදී භාණ්ඩවල අමුණා ඇති, ගුවන් විදුලි සංඥා හැඳුනුම **(RF-ID)** හෝ තීරු කේත **(Bar Code)** එහි ඇති පරිලෝකකයක් මගින් හඳුනාගෙන, තොග පාලනයට ලබා දී ඇති තොරතුරු අනුව, භාණ්ඩ ඇණවුම් කිරීම සඳහා "දැනට පවතින ප්‍රමාණය" පරිශීලකට දන්වයි. මෙහි ඇති ආදාන, සැකසුම් සහ ප්‍රතිදාන උපාංග පිලිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?




   1). සුහුරු දර්ශන තලය, ගුවන් විදුලි සංඥා හැඳුනුම, ක්ෂුද්‍ර සකසනය
   2). ජංගම දුරකථනය, තීරු කේත, සුහුරු දර්ශන තලය
   3). තීරු කේත, ජංගම දුරකථනය, සුහුරු දර්ශන තලය
   4). ගුවන් විදුලි සංඥා හැඳුනුම, ක්ෂුද්‍ර සකසනය, සුහුරු දර්ශන තලය

3. "තුන්වන පරම්පරාවේ පරිගණකවල සිට පරිගණක දෘඩාංග පිරිවැය අඩු වී මෘදුකාංග පිරිවැය වැඩිවීමක් දක්නට ලැබුණි." යන ප්‍රකාශය සඳහා පහත දැක්වෙන පැහැදිලි කිරීම් සලකා බලන්න.

   **a.** නවීන තාක්ෂණය භාවිතයෙන් දෘඩාංග පිරිවැය අඩු වී ඇත.


   **b.** සංකීර්ණ මිනිස් අවශ්‍යතා මත, මෘදුකාංග නිෂ්පාදන පිරිවැයත් වාණිජ වටිනාකමත් ඉහල නැංවී ඇත.

   **a** සහ **b** අතුරින් ඉහත ප්‍රකාශය සඳහා සත්‍ය හා සාධාරණ පැහැදිලි කිරීම/කිරීම් වන්නේ,

   1). **a** පමණි. 2). **a** සහ**b** ප්‍රකාශ දෙකම සත්‍ය ය.
   3). **b** පමණි. 4). ප්‍රකාශ දෙකම අසත්‍ය ය.

4. සට්ටනය සහිත මුද්‍රණ යන්ත්‍රයකට උදාහරණයක් වන්නේ,

   1). තිත්න්‍යාස මුද්‍රකය 2). තාප මුද්‍රකය 3). ලේසර් මුද්‍රකය 4). තීන්ත විදුම් මුද්‍රකය

5. 


වාරක මතකයේ ක්‍රියාකාරිත්වය දැක්වීමට අඳින ලද ආකෘතියක් රූපයේ දැක්වේ. කඩ-ඊ තල මගින් දැක්වෙන දිශාවට ක්‍රියාවලිය සිදුවේ. **a, b, c** හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1). වාරක මතකය, ප්‍රාථමික මතකය, මධ්‍ය සැකසුම් ඒකකය

2). වාරක මතකය, මධ්‍ය සැකසුම් ඒකකය, ප්‍රාථමික මතකය

3). ප්‍රාථමික මතකය, මධ්‍ය සැකසුම් ඒකකය, වාරක මතකය

4). ප්‍රාථමික මතකය, වාරක මතකය, මධ්‍ය සැකසුම් ඒකකය

6. A අක්ෂරය ASCII වගුවේ $65_{10}$ ලෙස නිරූපණය වේ නම්, ASCII වගුව අනුව Google යන වචනය නිරූපණයේ දී " G" අක්ෂරයේ ද්විමය නිරූපණය කුමක් ද?

1). 1000111 2). 1100111 3). 1011001 4). 1000100


7. ආරක්ෂා සහිත අංකිත ආචයන කාඩ් පතක ධාරිතාව 64 GB වේ. එම ධාරිතාවට සමාන අගයක් දැක්වෙනුයේ පහත සඳහන් කවර පිළිතුරකින් ද?


1). $2^{32}$ KB 2). $2^{6}$ MB 3). $2^{26}$KB 4). $2^{16}$ byte

8. $29E_{16}$ සංඛ්‍යාව සලකන්න. මෙහි **2** හි බර සාධකය වනුයේ කුමක් ද?

1). $16^{2}$ 2). $16^{0}$ 3). $16^{3}$ 4). $16^{-2}$

9. පහත දැක්වෙන විවිධ ජාල රැහැන් වර්ග සලකා බලන්න. දත්ත සම්ප්‍රේෂණ සීඝ්‍රතාවය ආරෝහණ පිළිවෙලට දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?


A


B


C

1). A, B, C 2). C, A, B 3). A, B, C 4). C, A, B

10. ශාලාවක සිටින පිරිසකට 1 සිට 9 දක්වා අංක යෙදූ පත්‍රිකාවක් ලබා දී තමා නියෝජනය කරන පළාතට අදාළ අංකය පෑනෙන් හෝ පැන්සලකින් සලකුණු කිරීමට උපදෙස් ලබා දෙයි. ඔවුන් ලබා දෙන පිළිතුරු ස්වයංක්‍රීයව සුහුරු උපකරණයකට ආදානය කරගත හැකි වන්නේ පහත කුමක් මගින් ද?

1). චුම්බක තින්ත අනුලක්ෂණ කියවනය (MICR) 2). තීරු කේත කියවනය (Bar Code Reader)

3). ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR) 4). ප්‍රකාශ සලකුණු සංජානනය (OMR)

11. මෙහෙයුම් පද්ධතියක් මගින් ඉටුකරන ක්‍රියාවන් ලෙස පහත දක්වා ඇති **A,B,C** ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

**A** - පරිගණකයේ මතක කළමනාකරණය

**B** - පරිගණක ජාල කළමනාකරණය

**C** - දෘඩ තැටිය පංගුවලට වෙන් කිරීම

1). **A** පමණි. 2). **A** සහ **B** පමණි. 3). **B** සහ **C** පමණි. 4). **A B** සහ **C** යන සියල්ල

12. පරිගණක අතුරු මුහුණත් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1). පරිශීලකයා සහ පරිගණක දෘඩාංග අතර සම්බන්ධතාව ඇති කරනු ලබන්නේ මෙහෙයුම් පද්ධතියයි.

2). විධාන පේළි අතුරු මුහුණතක් හෝ චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් හරහා පරිගණකය සමග සන්නිවේදනය කිරීමට අවස්ථාව පරිශීලක සතුව පවතී.


3). චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් නිර්මාණයේ දී මිත්‍රශීලි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා **WIMP** සංරචක භාවිතා කර ඇත.


4). විධාන පේළි අතුරු මුහුණත් මෙහෙයුම් පද්ධති භාවිතයේ දී යතුරු පුවරුව සහ මූසිකය භාවිතයෙන් දත්ත ආදානය කළ හැක.

13. වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් යතුරු ලියනය කරන ලද ලේඛනයක ස්ථාන කිහිපයක, වැරදීමකින් "වර්ෂ 2019" ලෙස සටහන්ව ඇත. මෙය 2020 ලෙස එකවර නිවැරදි කිරීම සඳහා යොදා ගතහැකි කෙටිමං යතුර වන්නේ කුමක් ද?

1). Ctrl + C 2). Ctrl + V 3). Ctrl + H 4). Ctrl + R

14. පහත ආකෘති කරන ලද වගුව සලකන්න.





ඉහත **A B C** මගින් පෙන්වන ලද ආකෘතිකරණ සඳහා යොදාගත් 1,2,3 අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

1). 2,3,1 2). 1,3,2 3). 1,2,3 4). 3,2,1

15. වදන් සැකසුම් මෘදුකාංගයක් සහ සමර්පණ මෘදුකාංගයක් ක්‍රියාත්මක කිරීමේ දී සමාන ප්‍රතිඵල නොලැබෙන යතුරු සංයෝජනය වන්නේ,

1). Ctrl + C 2). Ctrl + V 3). Ctrl + G 4). Ctrl + X

16. විද්‍යුත් සමර්පණයක "කදාවන් හි අනුපිළිවෙළ සකස් කිරීම" සහ තෝරා ගත් කදාවක් පූර්ණ තිරයේ "සමර්පණ රාමු දසුන ආකාරයට දැක ගැනීමට" භාවිතා කළ හැකි, දසුන් තීරුවේ නිරූපක පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?




1). A , B 2). B , C 3). B , D 4). A , C

17. විද්‍යුත් සමර්පණයක් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය සඳහන් වන්නේ පහත කිනම් පිළිතුරේ ද?

1). කදා දර්ශනය කිරීම F5 යතුරෙන් සිදු කළ හැක.

2). කදා සුබෙදුම් දසුනේ (Slide Sorter View ) සිට කදාවේ පසුබිම් වර්ණය වෙනස් කළ හැක.

3). Ctrl + M යතුරු සංයෝජනය භාවිතයෙන් අලුතෙන් කදාවක් ඉ - සමර්පණයට ඇතුළත් කළ හැක.

4). ඉ - සමර්පණයක් දෘෂ්‍ය පසුරක් ලෙස ආචයනය කළ නොහැක.

* **18** සහ **19** ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට  මෙම පැතුරුම් පත් කොටස යොදා ගන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | Item No. | Item Name | Regular Price | Sale Price |
| 2 | S1001 | Shirt | Rs: 1,250.00 | 1000 |
| 3 | P1003 | Frock | Rs: 2,500.00 | |
| 4 | G1005 | Jacket | Rs: 1,350.00 | |
| 5 | T1004 | T-Shirt | Rs: 960.00 | |
| 6 | Discount | | 20% | |
| 7 | Total | | | |

18. එක්තරා රෙදිපිළි වෙළඳසැලක සෑම භාණ්ඩයකටම, වර්ෂ අවසානයේ දී ලකුණු කළ මිලෙන් 20% වට්ටමක් ලබාදේ. S1001 ට අදාල භාණ්ඩයේ විකුණුම් මිල ලබා ගැනීමට D2 කෝෂයේ ලියන සූත්‍රය (ඉතිරි කෝෂ වලට පිටපත් කළවිට එම කෝෂවලට අදාල ලබා ගැනීමට ගැලපෙන සූත්‍රය) වනුයේ,
    1). =C2-C2*C6    2). =C2-C2*$C6    3). =C2-C2*C$6    4). =C$2-C$2*C6

19. රෙදිපිළි වෙළඳාමේ විකුණුම් මිළ එකතුව ලබා ගැනීමට **D7** කෝෂයට ලිවිය යුතු නිවැරදි **SUM** ශ්‍රිතය දැක්වෙන ප්‍රකාශ/ය වන්නේ,
    A. =SUM(D2,D3,D4,D5)
    B. =SUM(D2:D5)
    C. =SUM(D2,D3:D5)
    1). A    2). B    3). A, B සහ C    4). A සහ C





20. විද්‍යුත් පැතුරුම් පතකට **=2^2/(5-1^2)*3** සූත්‍රය ඇතුලත් කළවිට ලැබෙන අගය වන්නේ කුමක් ද ?
    1). 4    2). 6    3). 3    4). 5

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | 3 | | 6 | |
| 3 | AB | | 5 | 8 |
| 4 | 7 | | | |
| 5 | | | | 9 |
| 6 | | | | |

රූපයේ දැක්වෙන විද්‍යුත් පැතුරුම්පත් කොටස යොදාගෙන 21 , 22 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

21. එහි D6 කෝෂය තුල=SUM(A3:D5) ශ්‍රිතය ඇතුළත් කළ විට ලැබෙන පිළිතුර වන්නේ කුමක් ද?
    1). 29    2). 38    3). 13    4). 22

22. A6 කෝෂයේ =count(A1:A5) ශ්‍රිතය ඇතුළත් කළවිට ලැබෙන අගය වනුයේ කුමක් ද?
    1). 6    2). 5    3). 3    4). 2

23. $Y = 2X^2 + 1$ ශ්‍රිතය සඳහා පැතුරුම්පතක් තුල අදාල සුමට වක්‍රය නිර්මාණයට අවශ්‍ය වන ප්‍රස්තාර මෙවලම දැක්වෙන පිළිතුර කුමක් ද?
    1). 
    LINE
    2). 
    X,Y SCATTER
    3). 
    PIE
    4). 
    COLUMN

24. දත්ත සමුදාය පද්ධතියකට අදාලව නිවැරදි වන්නේ පහත කුමන පිළිතුර ද?
    1). වගුවක ආගන්තුක යතුරක් ඇතුලත්ව තිබිය යුතුමය.
    2). වගුවක එක ක්ෂේත්‍රයක් පමණක් තිබීම ප්‍රමාණවත් වේ.
    3). වගුවක ප්‍රාථමික හෝ සංයුක්ත යතුරක් තිබිය යුතුමය.
    4). වගුවක ප්‍රාථමික හෝ සංයුක්ත යතුරක් නොතිබිය හැකිය.

25. "EM2002"යන දත්තය ඇතුලත් කළ යුතු ක්ෂේත්‍රයේ තිබිය යුතු දත්ත ප්‍රරූපය **(data type)** වන්නේ,
    1). Text    2). Numbers    3). Boolean    4). Date/Time

26. පාසලෙහි ගුරුවරුන්ගේ දත්ත ඇතුලත් කිරීමට වගුවක් සකස් කරන්නේ නම් එහි ඇතුලත් විය යුතුම ක්ෂේත්‍ර විය යුත්තේ,
    **a.** ගුරු-හැඳුනුම්පත් අංකය  **b.** විදුහල්පතිගේ නම  **c.** විදුහල්පතිගේ ලිපිනය  **d.** උගන්වන විෂය
    **e.** පාසලෙහි දුරකතන අංකය  **f.** පාසලෙහි ලිපිනය  **g.** ගුරුවරයාගේ නම
    1). a, b, c, d    2). a,d,e,f,g    3). a,b,c,d,e,f    4). a,c,d,g

27. මෙම වගුව සම්බන්ධයෙන් සත්‍ය වගන්තිය වන්නේ,

| අනු අංකය | නම | ක්‍රීඩාව | ස්ථානය |
|---|---|---|---|
| A1001 | තිසල් නයනජිත් ගමගේ | ක්‍රිකට් | 2 |
| A1002 | කසුන් නිශාන්ත කුඩාගම | වොලිබෝල් | 3 |
| A1001 | තිසල් නයනජිත් ගමගේ | පිහිනුම් | 1 |
| A1002 | කසුන් නිශාන්ත කුඩාගම | ක්‍රිකට් | 1 |

1). ප්‍රාථමික යතුරක් නොමැත.
2). දත්ත සංගතතාවයක් පවතී.
3). දත්ත සමතිරික්තතාවයක් පවතී.
4). සංයුක්ත යතුරක් නොපවතී.

28. දත්ත සමුදාය පද්ධතියකින් ඇති වාසියක් නොවන්නේ,

1). අඩු ඉඩ ප්‍රමාණයක වැඩි දත්ත ප්‍රමාණයක් ගබඩා කළ හැකි වීම
2). වැඩි ඉඩ ප්‍රමාණයක අඩු දත්ත ප්‍රමාණයක් ගබඩා කළ හැකි වීම
3). දත්ත පහසුවෙන් හැසිරවිය හැකි වීම
4). දත්ත අස්ථානගත වීම වැලකීම

29. මෙහි දැක්වෙන ව්‍යාජ කේත කොටසට අදාල ප්‍රතිදානය සඳහන් නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද ?

```
Begin
        Writeln('January');
        Writeln('February');
        Writeln('March');
        Write('April');
End
```

1).
```
Writeln('January')
Writeln('February')
Writeln('March')
Write('April')
```

2).
```
January
February
MarchApril
```

3).
```
January
February
March
April
```

4).
```
January, February, March, April
```

30. පරිගණක භාෂා හඳුනා ගැනීම සඳහා විවිධ වර්ගීකරණයන් ඉදිරිපත් කර තිබේ. පහත දැක්වෙනුයේ එවැනි වර්ගීකරණයක ලක්ෂණ කිහිපයකි.

- වැඩ සටහනක් ලිවීමට ගතවන කාලය අඩු වන අතර ලිවීම සහ නවීකරණය කිරීම පහසුය.
- පටිපාටිගත නොවන (Non-procedural Language) භාෂා වේ.
- මෘදුකාංග සංවර්ධනය සඳහා යන පිරිවැය අවම වේ.
- යන්ත්‍ර භාෂාවට (Machine Language) හැරවීම සඳහා පරිවර්තන මෘදුකාංගයක් උළු **:-Focus, Ideal,** dbase III Plus, SQL අවශ්‍ය ය.

ඉහත ලක්ෂණ වලින් දැක්වෙන්නේ කුමන ක්‍රමලේඛන භාෂා ලක්ෂණ ද?

1). යන්ත්‍ර භාෂාව
2). එසෙම්බ්ලි භාෂාව
3). ඉහළ තලයේ භාෂා
4). දෘඪාංග එළවුම්


31. **X** යනු නිඛිලමය විචල්‍යයක් නම් පහත සඳහන් කේතය ක්‍රියාත්මක වන වාර ගණන,

```
X = 10
Do While X > 5
        X = X-1
Loop
```

1). **6** කි.
2). **5** කි.
3). **4** කි.
4). කිසි විටෙකත් අවසන් නොවේ.

32. පහත දැක්වෙනුයේ කාමර උෂ්ණත්වය හිමාංකයට පහළින් ද නැතහොත් ඉහළින් ද යන්න තීරණය කරන ගැලීම් සටහනකි. උෂ්ණත්වය (Temperature) 32°C වඩා වැඩිනම් "Above Freezing" ලෙස ද, නැතිනම් "Below Freezing" ලෙස ද පෙන්වයි. X,Y හා Z ලේබල සඳහා ලිවිය යුතු පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1). No, Temperature < 32 ?, Yes
2). Yes, Temperature < 32 ?, No
3). Yes, Temperature <= 32 ?, No
4). Yes, Temperature > 32 ?, No




33. පහත දැක්වෙන ව්‍යාජ කේතයේ ප්‍රතිදානය කුමක් වනු ඇත් ද?

```
for n = 3 to 1 do
    Print n
    n = n-1
end for
```

1). **3 1**　　2). **3 2 1**
3). **3**　　4). කිසිවිට නොනවතී.

34. පහත දැක්වෙන ව්‍යාජ කේතයේ ප්‍රතිදානය කුමක් වේ ද?

```
        m=9, n=6
m=m+1
n=n-1
m=m+n
  if (m>n)
        print m
  else
        print n
  end if
```

1). **6**
2). **5**
3). **10**
4). **15**

35. තොරතුරු පද්ධතියක විසඳුම් සැලසුම් කිරීමේ පියවරේ දී ඉටුවන කාර්යයක් ලෙස සැලකිය නොහැක්කේ පහත සඳහන් ප්‍රකාශ අතුරින් කවරක් ද?

1). පරීක්ෂණ සැලසුම් කිරීම　　2). මූලාදර්ශ භාවිතය
3). උප පද්ධතිවල පරායත්ත බව හඳුනා ගැනීම.　　4). මෘදුකාංග හා මෘදුකාංග නිර්මිතය හඳුනා ගැනීම


36. එක් වතාවකට කුඩා කොටසක් බැගින් නැවත නැවත අලුත් කොටස් එක් කරමින් ක්‍රමයෙන් පද්ධතිය ගොඩනැගීමේ ක්‍රියාවලිය අයත්වන පද්ධති සංවර්ධන ආකෘතිය හඳුන්වනු ලබන්නේ,

1). දියඇලි ආකෘතිය　　2). පුනර්කරණ වෘද්ධි ආකෘතිය
3). මූලාකෘති ආකාතිය　　4). ඉහත කිසිවක් නොවේ.

37. ආදාන තුනක් සහිත **AND** ද්වාරයක ප්‍රතිදානය විය හැක්කේ,

1). X = AB　　2). X = ABC　　3). X = A + B + C　　4). X = AB + C

38. පහත පරිපථයේ A=1හා Y=1නම්,




1). B=1, C=1වේ.
2). B=0, C=1වේ.
3). B=1, C=0වේ.
4). B=0, C=0වේ.

39. මාර්ගගත සාප්පු සවාරිය (Online shopping) පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

A. ඕනෑම ස්ථානයක සිට ඇණවුම් කළ හැකි ය.

B. මුදල් ගෙවීමේ දී ණයපතක් (Credit Card) භාවිත කළ හැකි ය.

C. ඇණවුම් කළ භාණ්ඩයම ද යන්න පරීක්ෂා කළ නොහැකි ය.

1). **A** සහ **B** පමණි.
2). **A** සහ **C** පමණි.
3). **B** සහ **C** පමණි.
4). **A, B** සහ **C** සියල්ලම

40. "කෘෂි කර්මාන්තයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) භාවිතය'' සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර වගන්ති සත්‍ය වේද?

A. විවිධ පොහොර ශාක වලට ඇති කරන බලපෑම පිළිබඳ තොරතුරු වෙබ් අඩවි හරහා ගොවීන්ට දැනගත හැකිය.

B. ගොවීන්ගේ අස්වැන්න විකිණීම සඳහා මාර්ගගත සාප්පු සවාරි (Online Shopping) පහසුකම භාවිත කිරීම.

C. විවිධ ප්‍රදේශ වල පවතින කාලගුණික තත්වය පිළිබඳ ගොවීන්ට දැනුම් දීම.

1). **A** සහ **B** පමණි
2). **B** සහ **C** පමණි
3). **A** සහ **C** පමණි
4). **A, B** සහ **C** යන සියල්ලම

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I, II

නම/විභාග අංකය :- ..........................................................

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II


සැලකියයුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිලිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.


01). i). වර්තමානයේ පුද්ගලයින්ගේ දුරකථන සහ දෘශ්‍ය සංවාද ඔවුන් නොදැනුවත්ව පටිගත කොට සමාජ ජාල වෙබ් අඩවි තුල පොදුවේ මුදා හැරීම සුලභ කරුණක් වී ඇත. මේ කාර්යය මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයට සිදු විය හැකි අහිසි බලපෑම් දෙකක් ලියන්න.

ii). පොතක මිල රු160/= ක් වන අතර පෑනක මිල රු 40/= ක්වේ. පොතක සහ පෑනක මිල එකතුව, ද්විමය ආකාරයෙන් දක්වන්න.

iii). පියකු, තම පුතුගේ උපන්දිනය සඳහා කතා කරන ඉලෙක්ට්‍රොනික ගිරවෙකු තෑගි කරයි. බොත්තම් ස්විච් දෙකක් මගින් මෙය දුරස්ථව පාලනය කල හැක. බොත්තම් දෙකම ක්‍රියාත්මක කර නැති විට හෝ දෙකම ක්‍රියාත්මක කර ඇති විට හෝ ගිරවා කතා නොකරන අතර, බොත්තම් දෙකින් එකක් පමණක් ක්‍රියාත්මක කල විට ගිරවා කතා කරයි. කතා කරන ගිරවාගේ ක්‍රියාවලිය හා අනුරූප වන සංඛ්‍යාංක පරිපථය පහත රූපයේ දැක්වේ . එහි A , B සහ C සඳහා සුදුසු තාර්කික ද්වාර ලියා දක්වන්න.




iv). මාර්ගගත ජාතික ශිෂ්‍ය තොරතුරු පද්ධතියට **(NSIS)** ඇතුල්වීමේ ක්‍රියාවලිය ගැලීම් සටහනේ දැක්වේ. ගැලීම් සටහනෙහි **A, B, C, D** ලේබල මගින් දක්වා ඇති ස්ථාන සඳහා යෙදිය යුතු නිවැරදි වගන්ති, පහත පෙන්වා ඇති වගුවෙන් හඳුනා ගන්න. එක් එක් ලේබලය හා ගැළපෙන වගන්තියේ අංකය ලියා දක්වන්න.




| වගන්තියේ අංකය | වගන්තිය |
|---|---|
| 1 | "වැරදියි" ප්‍රතිදානය කරන්න. |
| 2 | පරිශීලක නාමය හා මුරපදය වලංගු ද? |
| 3 | පරිශීලක නාමය හා මුරපදය ඇතුළත් කරන්න. |
| 4 | පරිශීලකයා පද්ධතියට ඇතුළු කරන්න. |

(v) පහත පෙන්වා ඇති ලේඛනය වදන් සැකසුම් මෘදුකාංගයක් උපයෝගී කර ගනිමින් සකස් කර, 1 සිට 4 තෙක් ලේබල මගින් දක්වා ඇති පරිදි හැඩසව් **(Format)** ගන්වා ඇත. ලේඛනයේ අක්ෂර ප්‍රමාණය **(Font size)** වෙනස් කර නොමැත. දකුණුපස දැක්වෙන මෙවලම් අතරින් හැඩසව් ගැන්වීම සඳහා යොදාගෙන ඇති මෙවලම් අක්ෂරය, අදාල අංකය සමග ගලපා ලියා දක්වන්න.

**A- Bold** ..........
**B- Superscript** ..........
**C- Subscript** ..........
**D- Numbering** ..........
**E- Font color** ..........
**F- Bullets** ..........

හැඩසව් ගැන්වීමට පෙර

As shown in the table above (Table 3.12), four bits are used to indicate a hexadecimal number in binary form. (16 = 24 )
Example
Converting number 101102 to a hexadecimal number.
First, divide the number into four-bit clusters from the right corner to the left corner.
Write hexadecimal numbers separately for each cluster.
Write these numbers in order from the left corner to the right corner and write

හැඩසව් ගැන්වීමෙන් පසු

As shown in the table above (Table 3.12), four bits are used to indicate a hexadecimal number in binary form. ($16 = 2^4$) (1)

(2) **Example**


Converting number $10110_2$ (3) to a hexadecimal number.

(4)
- First, divide the number into four-bit clusters from the right corner to the left corner.
- Write hexadecimal numbers separately for each cluster.
- Write these numbers in order from the left corner to the right corner and write down the base.


vi). පරිගණකයේ සුමට ක්‍රියාකාරීත්වයට සහ උපද්‍රව වලින් පරිගණකය ආරක්ෂා කිරීමට මෙහෙයුම් පද්ධතිය තුලට උපයෝගීතා වැඩසටහන් එක්කර ඇති අතර, යෙදවුම් මෘදුකාංග ද කිසියම් විශේෂඥ කාර්යයක් ඉටුකරයි. පහත දී ඇති වචන ලැයිස්තුවෙන් උපයෝගී සහ යෙදවුම් ලෙස මෘදුකාංග වෙන්කර දක්වන්න.

<u>වචන ලැයිස්තුව</u> : සෙවුම් යන්ත්‍ර, තැටි නිර්ඛණ්ඩකය, පැතුරුම් පත් මෘදුකාංග, තැටි පරිලෝකන මෘදුකාංග, වදන් සැකසුම් මෘදුකාංග, උපස්ථ මෘදුකාංග, චිත්‍රක සැලසුම් මෘදුකාංග

Vii).




බාහිර උපාංග





පද්ධති ඒකකය

දක්වා ඇති බාහිර උපාංග, පද්ධති ඒකකයට සම්බන්ධ කිරීමට ගැලපෙන කෙවෙණි අංකය තෝරා **A - F** අක්ෂර ඉදිරියෙන් ලියන්න. (එක් උපකරණයකට කෙවෙණි කිහිපයක් ගැලපිය හැක)

viii). අසනීප වී රෝහලක සිටින පුද්ගලයින් කිහිප දෙනකු විසින් සිදුකරන ක්‍රියාකාරකම් කිහිපයක් පහත වගුවේ දැක්වේ. **A, B, C, D** ක්‍රියාකාරකම් වලට ගැලපෙන ක්ෂේත්‍ර අංක ගලපා ලියා දක්වන්න.

| | ක්ෂේත්‍රය | | ක්‍රියාකාරකම |
|---|---|---|---|
| 1 | තොරතුරු තාක්ෂණය මගින් විනෝදාස්වාදය | **A** | රෝගියා නිවසේ රඳවා තත්ව පරීක්ෂණ සඳහා අන්තර් - සබැඳි නිරීක්ෂණ යන්ත්‍ර යොදාගැනීම |
| 2 | දුරස්ථ වෛද්‍ය ප්‍රතිකාර (Tele - Medicine) | **B** | හදිසි අනතුරකට ලක්වී රෝහල් ගතවූ දරුවෙක් රෝහලේ සිට මාර්ග ගත GIT විභාගයට පෙනී සිටීම. |
| 3 | අධ්‍යාපන කළමනාකරණ පද්ධති | **C** | රෝහලේ ඇඳ මත සිටින රෝගියකු සිය රෝහල් ගාස්තුව ජංගම දුරකථනය භාවිතයෙන් සිය බැංකු ගිණුම මගින් රෝහලට ගෙවීම |
| 4 | E - බැංකු කටයුතු E-banking | **D** | අතපසුවූ රූපවාහිනී සංගීත වැඩසටහනක් අන්තර්ජාලය හරහා නැරඹීම |

ix). දකුණු පස රූපයේ දැක්වෙනුයේ පරිගණයක ඇති දෘඩාංග සහ මෘදුකාංග, පරිශීලක සමග ස්තර වශයෙන් සම්බන්ධ වන ආකාරයයි. පහත සඳහන් මෘදුකාංග සහ දෘඩාංග අයත්වන ස්ථරයට අදාල අක්ෂරය, එය ඉදිරියේ ලියන්න.




වදන් සැකසුම් මෘදුකාංග ..................

යතුරු පුවරුව ..................

වෙබ් අතිරික්සුව ..................

ප්‍රතිවෛරස මෘදුකාංග ..................

මෙහෙයුම් පද්ධතිය ..................

x). දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය තම ආයතනයේ භෞතික සම්පත් පිලිබඳ අත්යුරු තොරතුරු පද්ධතියක් පවත්වාගෙනයයි. 2020 වසරේ සිට එය පරිගණක ගත තොරතුරු පද්ධතියක් බවට පත්කිරීමට සැලසුම් කර ඇත. එමගින් එම ආයතනයට ලැබෙන වාසි දෙකක් සහ අවාසි දෙකක් ලියන්න.

02). ද්විතීක පාසලක් වන සාලිය විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති සිරිපාල මහතා පාසලේ දෛනික සිසු පැමිණීම පහත ආකාරයේ පැතුරුම් පතකට ඇතුලත් කොට පාසල් කළමනාකරණයට අවශ්‍ය තොරතුරු එමගින් ලබා ගනී .

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | Daily attendance Repot | | | | | | |
| 2 | GRADE | Monday | Tuesday | Wednesday | Thursday | Friday | Weekly Average |
| 3 | GRADE 6 | 75 | 100 | 80 | 90 | 100 | 89 |
| 4 | GRADE 7 | 60 | 80 | 68 | 100 | 75 | 76.6 |
| 5 | GRADE 8 | 100 | 90 | 110 | 80 | 75 | 91 |
| 6 | GRADE 9 | 70 | 72 | 80 | 80 | 78 | 76 |
| 7 | GRADE 10 | 89 | 80 | 100 | 80 | 88 | 87.4 |
| 8 | GRADE 11 | 50 | 65 | 67 | 78 | 90 | 70 |
| 9 | GRADE 12 | 110 | 100 | 90 | 90 | 92 | 96.4 |
| 10 | GRADE 13 | 40 | 50 | 60 | 45 | 50 | 49 |
| 11 | Totale Of Daily attendance | 594 | 637 | 655 | 643 | 648 | |
| 12 | Daily Average | 132 | 142 | 146 | 143 | 144 | |
| 13 | | | | | | | |

i). සඳුදා දින සාමාන්‍ය පැමිණීම ලබා ගැනීමට **B12** කෝෂයට ඇතුලත් කළ යුතු සූත්‍රය,

=ශ්‍රිතය (කෝෂය1:කෝෂය2) ආකාරයට ලියන්න.

ii). මෙම සූත්‍රය **E 12** කෝෂයට පිටපත් කළේ නම් **E12** හි දිස්වන සූත්‍රය ලියන්න.

iii). සතියේ දින 05 ක ශිෂ්‍ය පැමිණීමේ සාමාන්‍යය අගය දැක්වීම සඳහා සිරිපාල මහතාට **COUNT** සහ **SUM** ශ්‍රිත පමණක් භාවිතා කර ලිවියහැකි සූත්‍රය ලියා පෙන්වන්න.

iv). පාසලේ තොරතුරු තාක්ෂණ විෂය ගුරුතුමා එම සූත්‍රය, = ශ්‍රිතය (කෝෂය1:කෝෂය2) ආකාරයෙන් ලිවීමට යෝජනා කරයි. එම ශ්‍රිතය ලියා පෙන්වන්න.

v). බදාදා දිනක පැමිණි වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාව සොයා ගැනිමට **D13** කෝෂයට ලියන සූත්‍රය =ශ්‍රිතය(කෝෂය1:කෝෂය2) අකාරයට ලියන්න.

03). **“SmartTecho”** නම් වෙළඳ ආයතනය සැපයුම්කරුවන්ගෙන් **(Supplier)** ඉලෙක්ට්‍රොනික උපකරණ **(Items)** මිලදී ගෙන **(Purchase)** විකිණීම සිදු කරයි. ඊට අදාල දත්තපාදකය පහත දැක්වේ.

**Item Table**

| Item ID | Item Name | Price | Stock |
|---|---|---|---|
| I1001 | Smartphone | Rs 40 000.00 | 20 |
| I1002 | Laptop | Rs 110 000.00 | 18 |
| I1003 | PCs | Rs 65 000.00 | 45 |

**Supplier Table**

| Sup ID | Name | Contact No |
|---|---|---|
| S201 | Kamal Perera | 0112112381 |
| S202 | Sachi Gamage | 0714832212 |
| S203 | Ravi Roy | 0771231234 |

**Purchase Table**

| Item ID | Sup ID | Date (DD/MM) | Quantity |
|---|---|---|---|
| I1001 | S202 | 22/09 | 30 |
| I1002 | S201 | 05/10 | 20 |
| I1003 | S201 | 13/11 | 50 |

ඉහත දත්ත උපයෝගී කරගනිමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

**i).** ඉහත දත්ත පාදකය සඳහා ප්‍රාථමික යතුරු **(Primary Key)** දෙකක් වගුවේ නම සමඟ සඳහන් කරන්න .


**ii).** **Sachi Gamage** නම් සැපයුම්කරුවා මගින් **Headphone** 25 ක් 31/12 දින ලබා ගත්තේ නම්,

1. යාවත් කාලීන වන වගු මොනවා ද?
2. යාවත් කාලීන වන රෙකෝඩ ලියා දක්වන්න. (අවශ්‍ය ක්ෂේත්‍ර-වටිනාකම් උපකල්පනය කරන්න)

**iii).** ඉහත දැක්වෙන පරිදි, දත්ත වෙන් වෙන්ව වගුවල පැවතීමත් පහත දැක්වෙන පරිදි එක් වගුවක සියල්ල දැක්වීමත් අතරින් වඩා සුදුසු ක්‍රමවේදය කුමක් ද ? පහදන්න.

| Item ID | Item Name | Price | Supplier | Contact No | Quantity | Stock |
|---|---|---|---|---|---|---|
| I1001 | Smartphone | Rs 40 000.00 | Kamal Perera | 0112112381 | 30 | 20 |

04). පාසල් පරිගණක විද්‍යාගාරයක ඇති පරිගණක, අන්තර්ජාලය හා සම්බන්ධ වී ඇති අයුරු දැක්වෙන රූප සටහනක් පහතින් දැක්වේ.




i). පරිගණක විද්‍යාගාරය තුල **C** අක්ෂරයෙන් හඳුන්වා ඇති මෙම පරිගණක ජාල වර්ගය සහ පරිගණක ජාල ස්ථල විද්‍යාව **( Network Topology)** හඳුන්වන නම් ලියන්න.

ii). **A** සහ **B** නම් කරන්න.


iii). පාසල් විද්‍යාගාරය තුල මෙවැනි පරිගණක ජාලයක් භාවිතයේ ඇති වාසි දෙකක් ලියන්න.

iv). පරිගණක විද්‍යාගාරයට යාබදව පිහිටි කාර්යාලයේ ඇති මේස පරිගණකය මෙම ජාලයට සම්බන්ධ කිරීම සඳහා සුදුසු පරිගණක ජාල රැහැන් ( **Network Cable** ) වර්ගය කුමක් ද? ඒ සඳහා එම පරිගණකය තුළ සවි කර තිබිය යුතු උපාංගයක් ( **Component**)ලියා දක්වන්න.

v). මෙම පරිගණක ජාලය සඳහා ගිනි පවුර යොදා ගන්නේ නම් ඉන් ඉටු වන කාර්යයක් ලියන්න.

**05.** **BMI** අගය ගණනය කිරීමට වැඩසටහනක් සකස් කිරීමට ඔබට උපදෙස් ලබා දී ඇතැයි සිතන්න. **BMI** අගය 25.0 හෝ ඊට වැඩි නම් **"over-weight"**ලෙස ද 18.5 - 24.9 අතර නම් **"Healthy"**ලෙස ද එසේ නොමැති නම් **"under-weight"**ලෙස ද ප්‍රතිදානය කිරීමට පහත ගැලීම් සටහන සකසා ඇත.

$$\boldsymbol{BMI = \frac{weight(Kg)}{height^2(m^2)}}$$




**a)** **A,B,C,D,E,F,G,H** ස්ථානවල ඇති හිස්තැන් සම්පූර්ණ කරන්න.


b) ඉහත ගැලීම් සටහනට අදාල ව්‍යාජ කේත කොටස සම්පූර්ණ කරන්න.

**Begin**
**Weight = 0**
**Height = 0**
**Display "Enter height and weight"**
...............................................
**BMI = weight/ height²**
.......................................................
.......................................................
**Elseif**
.......................................................
.......................................................
**Else**
**Display "Healthy"**
**End**

06) i). පරිගණකයක ගොනුවක් තැන්පත් කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් ලාක්ෂණික තොරතුරු ගණනාවක් පවත්වාගෙන යනු ලබයි. ඉන් දෙකක් ලියා දක්වන්න.

ii). පරිගණකය තුල ගොනු, ක්‍රමානුකූලව ආචයනය සඳහා, ෆෝල්ඩර් **(Folder)** ව්‍යුහයන් යොදා ගනියි. ව්‍යාපාරිකයෙකු වන සමන්, තම විවේක කාලය ගත කිරීම සඳහා සිංහල , දෙමළ සහ ඉංග්‍රීසි චිත්‍රපට බැලීමට සහ සිංහල , ඉංග්‍රීසි සහ හිංදි ගීත ශ්‍රවණය කිරීමට පුරුදුව සිටියි. ඊට අමතරව වේදිකා නාට්‍ය වල ශ්‍රව්‍ය දෘෂ්‍ය **(Audio/Video)** පසුරු ආචයනය කර නැරඹීමට ද කැමැත්තක් දක්වයි. සමන් විසින් සකසන ලද ෆෝල්ඩර් **(Folder)** සහ උප ෆෝල්ඩර් **(Sub Folder)** පහත දක්වා ඇත. දී ඇති ලැයිස්තුවෙන් **A** සිට **F** දක්වා වූ උචිත ෆෝල්ඩර් **(Folder )** නාම එහි ලියා දක්වන්න.

(ෆෝල්ඩර් ලැයිස්තුව - සිංහල ,දෙමළ , ඉංග්‍රීසි , හිංදි , වේදිකා නාට්‍ය , චිත්‍රපට )





**iii). A)** ගාමිණී විද්‍යාලයේ පුස්තකාලයේ පොත් බැහැර දීම සහ ආපසු ලබා ගැනීම අත්යුරු ක්‍රමයට **(Manual System)** සිදු කරනු ලබයි . දැනට පවතින අත්යුරු පද්ධතිය පරිගණක ගත කිරීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න.

B) පුස්තකාලය පරිගණක ගත කිරීමට අදාලව පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ පළමු පියවර වන අවශ්‍යතා හඳුනා ගැනිමේ පියවරට අනුව පද්ධති විශ්ලේෂක විසින් තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේද තුනක් ලියන්න.

07). පාසලේ ශිෂ්‍ය සභාවට ඉදිරි පත් කිරීම සඳහා ඩෙංගු මර්ධනය පිලබඳ ඊ - සමර්පණයක් නිර්මාණය කිරිම 10 ශ්‍රේණියේ ශිෂ්‍යයෙකුට පවරා ඇත. පිලිතුරු සැපයිමට, අවශ්‍ය අවස්ථා වලදී රූපය යොදාගන්න.

**a).** i). සමර්පණයේ පලමු කදාවේ, ඩෙංගු මඩිමු අපි එක් වෙමු " හා "2020 10 ශ්‍රේණිය" යන ප්‍රකාශන, ජේලි දෙකක දැක්වීමට සුදුසු කදා පිරි සැලසුමට අදාල අක්ෂරය වන්නේ කුමක්ද ?

ii). දෙවන කදාවේ සිට කදා තුනක, පාසලේ තෝරා ගත් ස්ථාන තුනක ඡායාරූපයක් සහ විස්තරයක් බැගින් ඇතුලත් කලයුතු නම් සුදුසු පිරිසැලසුම් ආකෘතියට අදාල අක්ෂරය ලියන්න.




iii). 4 වන නවකදාව ලබා ගැනීම සඳහා යොදා ගතහැකි කෙටිමං යතුර කුමක්ද?

**iv)** සහ **v)** ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනයක් ලියන්න.

iv). 5 වන කදාවේ අවසානයේ "වැඩි විස්තර" වචනය මත ක්ලික් කර **https://www.dengue.lk** වෙබ් අඩවියට යාමට ...................... යොදා ඇත.

v). 6 වන කදාවේ ස්තුතියි යන්න සටහන්ව ඇත. ප්‍රදර්ශන අවස්ථාවේ එම වචනය වරකට එක් අකුර බැගින් දර්ශනය වීමට වචනය සඳහා ............................ යොදා ඇත.

**b).** i). ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණ යෙදවුම් භාවිතා කල හැකි ක්ෂේත්‍ර දෙකක් ලියන්න.

ii). මාර්ග ගත සාප්පුවක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයකුට ඇති වාසි දෙකක් ලියන්න.

iii). මාර්ග ගත දුරස්ථ අධ්‍යාපනයේ ඇති, ශිෂ්‍යයෙකුට වාසි දායක ගති ලක්ෂණ දෙකක් ලියන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## පිළිතුරු

සෑම විටම ශිෂ්‍යයාට සාධාරණයක් ඉටුවනසේ ලකුණු ලබා දීමට කාරුණික වන්න.

**Be kind enough to give marks to students reasonably**

## 1 කොටස/ Part 1

| ප්‍රශ්නඅංකය Question No | පිළිතුර Answer | ප්‍රශ්නඅංකය Question No | පිළිතුර Answer | ප්‍රශ්නඅංකය Question No | පිළිතුර Answer | ප්‍රශ්නඅංකය Question No | පිළිතුර Answer |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 2 | 21 | 1 | 31 | 2 |
| 2 | 4 | 12 | 4 | 22 | 4 | 32 | 3 |
| 3 | 2 | 13 | 3 | 23 | 1 | 33 | 2 |
| 4 | 1 | 14 | 2 | 24 | 4 | 34 | 4 |
| 5 | 4 | 15 | 3 | 25 | 1 | 35 | 2 |
| 6 | 1 | 16 | 3 | 26 | 2 | 36 | 2 |
| 7 | 3 | 17 | 4 | 27 | 1 | 37 | 2 |
| 8 | 1 | 18 | 3 | 28 | 2 | 38 | 2 |
| 9 | 3 | 19 | 3 | 29 | 2 | 39 | 4 |
| 10 | 4 | 20 | 3 | 30 | 3 | 40 | 4 |

## 2 කොටස/ Part 2

**1. i).**

- විශ්වාසය නොමැතිවීම, පහසු මාර්ගයක් භාවිතා නොකිරීමට පෙළඹීමෙන් අපහසුතා ඇතිවීම.


  **Face inconvenience for not using easy ways**
- අතිශය පෞද්ගලික තොරතුරු සමාජ ගත වීමෙන් අපහසුතාවයනට පත් වීම.

  **Face inconvenienceas extremely private matters are published**
- විදේශිකයින් ඉදිරියේ රට අවමානයට පත් වීම.

  **Getting dishonourto the country internationally**

**ii).** $200_{10} = 11001000_2$

**iii).**




| පිළිතුර /Answer | |
|---|---|
| A | AND |
| B | OR |
| C | AND |

| P | Q | A | B | C1 | C2 | R |
|---|---|---|---|---|---|---|
| 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 |
| 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 |
| 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 |

මෙම ලක්ෂ්‍ය සටහන සලකා සිසුනට තේරුම් කරන්න.

**Explain students considering these points.**

iv).

| | |
|---|---|
| A- Bold | ......2.... |
| B- Superscript | ......1.... |
| C- Subscript | ......3.... |
| D- Numbering | ............ |
| E- Font color | ............ |
| F- Bullets | ......4.... |

v).

| වගන්තියේ අංකය / Statement No | ලේබලය /Lable |
|---|---|
| 1 | C |
| 2 | B |
| 3 | A |
| 4 | D |

vi).

| යෙදවුම් මෘදුකාංග/ Application Software | උපයෝගිතා මෘදුකාංග/ Utility Software |
|---|---|
| වදන් සැකසුම් / Word processing | උපස්ථ මෘදුකාංග Backup Software |
| චිත්‍රක සැලසුම් Graphic designing | තැටි නිර්ඛණ්ඩකය Disk Defragment |
| සෙවුම් යන්ත්‍ර Search Engine | තැටි පරිලෝකන මෘදුකාංග Disk Scanning |
| පැතුරුම් පත් මෘදුකාංග Spread Sheet | |

vii).

| | | | |
|---|---|---|---|
| A | 9 | 10 | 11 |
| B | 10 | 11 | |
| C | 8 | 12 | |
| D | /7 | /6 | /5 |
| E | 3 | 10 | |
| F | 2 | | |

viii).

| ක්ෂේත්‍රය / Field | ක්‍රියාකාරකම /Activity |
|---|---|
| 1 | D |
| 2 | A |
| 3 | B |
| 4 | C |

ix). වදන් සැකසුම් මෘදුකාංග / **Text Editing Software** .........A..........

යතුරු පුවරුව **/Keyboard** .........C..........

වෙබ් අතිරික්සුව **/Web browser** .........A..........

ප්‍රතිවෛරස මෘදුකාංග **/ Antivirus Software** .........B..........

මෙහෙයුම් පද්ධතිය **/ Operating System** .........B..........

x). වාසි - ගබඩා ඉඩ කුඩා වීම, ලොව ඕනෑම ස්ථානයක සිට බැලියහැකි වීම, යාවත්කාලීන කිරීමේ හා නඩත්තු කිරීමේ පහසුව, ඉක්මන් හා ලාභදායී වීම

**Advantages –Less storage space/can view from any place in the world/Easy maintenance and update/Cheap and quick**

අවාසි-විදුලිය නැති විට අක්‍රිය වීම, තොරතුරු පැහැරගැනීමේ අවදානමක් තිබීම (ලකුණු 2 x 10)

**Disadvantages – Inactive, when having power cuts/Risk of stealing information (2 x 10 Marks&**

**02). i).** **=AVERAGE(B3:B10)**

**ii).** **=AVERAGE(E3:E10)**

**iii).** **= SUM(B11:F11)/COUNT(B11:F11)**

**iv).** **=AVERAGE(B11:F11)**

**v).** **=MAX(D3:D10)** (ලකුණු 2 x 5)(2 x 5 **Marks)**

**03). i).** **Item table - Item_ID, Purchase table- Item_IDසහ/ andSupplier table - Sup_ID**

**ii).** **1.** **Item table** සහ **/ andPurchase table**

**2.** **Item table**

| Item_ID | Item_Name | Price | Stock |
|---|---|---|---|
| I1004 | Headphone | Rs 6250.00 | 25 |

**Purchase Table**

| Item_ID | Sup_ID | Date | Quantity |
|---|---|---|---|
| I1004 | S202 | 31/12 | 25 |

iii). එක් විශාල වගුවක දැක්වීමේ දී එකම දත්තය නැවත නැවත ඇතුළත්වීමේ හැකියාව තිබේ. එවිට දත්ත අනුපිටපත්වී සංගතතාව නැතිවේ. යාවත්කාලීන කිරීමේ දී වේගය අඩුවන අතර, සියළු දත්ත අනුපිටපත් යාවත්කාලීන නොවීමෙන්අඩුපාඩු සිදුවිය හැකි ය. දත්ත පාදකයේ විශාලත්වය වැඩි වන අතර සංකීර්ණ බව ද වැඩි වේ. මේ අනුව දත්ත වෙන් වෙන්ව වගුවල පැවතීම වඩාත් සුදුසු ආකාරය වේ.(ලකුණු 2 x 5&

**When entering data into a Largetable, it can be entered repeatedly. It keeps in consistency. Speed reduces when updating, and all the copies of data may not be updated andthis leadsshortcomings. Size of the database and complexity can be increased. Accordingly the most suitable way is to keep data separately in tables.** (2 x 5 Marks)

**04)**

**i).** ස්ථානීය ප්‍රදේශ ජාලයකි. තරු ආකාර ජාල ස්ථලයකි.**(Local Area Network/Star Topoloy)**

**ii).** **A -** මෝඩෙමය/ මාර්ගකය **B -** ජාල ස්විචය / නාභිය

**A - Modem /Router** **B - Network switch/Hub**

**iii).** වාසි - තරු ආකාර ජාල - අක්‍රිය වූ පරිගණකයක් පහසුවෙන් හා ඉක්මණින් ජාලයෙන් වෙන් කළ හැකිය. නව පරිගණකයක් හෝ උපාංගයක් පහසුවෙන් හා ඉක්මණින් ජාලයට ඇතුළත් කළ හැකි ය. ස්විචයක් යොදා ගත් විට වැඩි වේගයකින් පරිගණක අතර සන්නිවේදන කළ හැකි ය. ඉතා පහසුවෙන් අන්තර්ජාලයට හෝ වෙනත් ජාලයකට සම්බන්ධ කළ හැකි ය. පළපුරුදු ජාල තාක්ෂණ සහකරුවකු අත්‍යවශ්‍ය නොවේ.

**Advantages – Star Topology –Inactive can be removed from the network easily and quickly.New computer or device can be entered to the network easily and quickly. By using a switch the speed of the communication among computers can be increased. Can be connected to internet or other network easily. No need to have experienced network technical assistant.**

**iv).** ජාල රැහැන් වර්ගය - වැසුණු/නොවැසුණු ඇඹරූ කම්බි සහිත රැහැන්

mරිගණකය තුළසවිකර තිබිය යුතු උපාංගය - ජාලකරණ අතුරුමුහුණත් කාඩ්පත

**(Type of cabels–Shielded/Unshielded Twisted Pair)**

**Network Interface Card – Device that should be fixed into a computer)**

**v).** ගිනි පවුරින් ඉටු වන කාර්යය - අන්තර්ජාලය හා පරිගණකය අතර ආරක්ෂක බාධකයක් සේ ක්‍රියා කරයි. අන්තර්ජාලය හා පරිගණකය අතර දත්ත හා තොරතුරු සම්ප්‍රේෂණය පාලනය කරයි. එසේම පරිගණක ජාල අතර තොරතුරු හුවමාරුවේ දී ඇතිවන තදබදය පාලනය කරයි. (ලකුණු 2 **x** 5)

**Function of Firewall – Acts as asecurity barrierbetween Internet and a computer. Control the data transmission between the internet and the computer. Controls internet trafficking when exchanging informationamong networks.** (2 x 5 Marks)

05). i).

| | |
|---|---|
| A | Is BMI <18.5ක |
| B | Yes |
| C | Under Weight |
| D | No |
| E | Is BMI > 25.0ක |
| F | Yes |
| G | Over Weight |
| H | No |

**(AB, ,C and D,E,F answers can be interchanged.)**

**(A, B, C**සහ **D,E,F**පිළිතුරු මාරු කළ හැක)

(ලකුණු 6 )**(6 Marks**)

b).

```
Begin Weight = 0
      Height = 0
      Display "Enter height and weight"
      Input height and weight
      BMI = weight/ height²
      If BMI <18.5 then
      Display "Under Weight"  } A
      Elseif                  }
      BMI >25.0 then
      Display "Over Weight"   } B
      Else                    }
      Display "Healthy"
      End
```

(ලකුණු 4 )(4 Marks)

(A සහ B පිළිතුරු මාරු කළ හැක)

(A and B answers can be interchanged.)

06). i) ලාක්ෂණික තොරතුරු ගොනුවේ නම, දිගුව, විවෘත කළ යුතු මෘදුකාංගය, ගොනු ධාරිතාව, නිමවූ දිනය, යාවත් කාලීන කළ දිනය..... (ලකුණු 1 )

**Characteristics**

**File name, File extension, software which should be opened, File capacity, Date completed, Date update ....** (1 Mark)

| | |
|---|---|
| A | චිත්‍රපට/ Films |
| B | වේදිකා නාට්‍ය/ Stage Drama |
| C | සිංහල / Sinhala |
| D | ඉංග්‍රීසි / English |
| E | හින්දි /Hindi |
| F | ඉංග්‍රීසි/ English |

(ලකුණු 4 )(4 **Marks**)

iii).

**A )** අත්යුරු පද්ධතිය පරිගණක ගත කිරීමෙන් ලැබෙන වාසි

වාර්ෂික තොග සමීක්ෂණ පහසු වීම, පොතක් සොයාගැනීමට යන වේලාව අඩු වීම, පොතක් බැහැර ගෙන ගොස් ඇතිදැයි බැලීමට හැකි වීම, ප්‍රමාද ගාස්තු නිවැරදිව අය කිරීමේ හැකියාව, පරිග්‍රහණ ලේඛණය මෙන් නොව මෙම ක්‍රමයේ දී වැඩි භෞතික ආරක්ෂාවක් ලැබීම, පුස්තකාලයාධිපති ට නිවසේ සිය සමීක්ෂණ කටයුතු කිරීමේ හැකියාව, පොත් මිළ දී ගැනීමට ගොස් සිටිය දී අවශ්‍යතා පිළිබඳව දත්ත පාදක පිරික්සීමේ හැකියාවක් තිබීම (ලකුණු 2 )

**B ) .**තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේද

සම්මුඛ සාකච්ඡා, පැරණි වාර්තා පිරික්සීම, ප්‍රශ්නාවලි ලබාදීම, නිරීක්ෂණය කිරීම.... (ලකුණු 3 )

**A)**

**Advantages of Computerizing a manual system**

**Easy annual stock taking, Taking less time to find a book /Ability to check whether a book is borrowed/ Ability to calculate fine(delaying fee)correctly/Not like in inventory, this method gives more security/Librarian can do his/her survey properlyeven at home / When buying a book can find the needs by checking the data base.** (2 Marks)

**B) Data Collecting methods**

**Interviews/ checking old reports/Giving questionnaires/ Observations …** **(**3 Marks)

**07). a). i).** **A**

**ii).** **H**

**iii).** **Ctrl+M**

**iv).** **Hyperlink**

**v).** **Text Effect** (ලකුණු 4 )**(**4 **Marks**)

b**).**

**i ).** කර්මාන්ත ක්ෂේත්‍රය, කෘෂිකාර්මික ක්ෂේත්‍රය, ප්‍රවාහන ක්ෂේත්‍රය (ලකුණු 2 )

**(Field of ….Industry /Agriculture/Transport)** **(**2 **Marks**)

**ii).** ගබඩා කිරීමේ වියදම අඩු වීම, 24 **x** 7 ld,fha wf,වි කිරීමේ හැකියාව, විදෙස් රටවලට වුව ද අලෙවි කිරීමේ හැකියාව (ලකුණු 2 )

**Storage cost is less/ Ability to sale 24x7/ ability sale even to foreign countries**

**(**2 **Marks**)

**iii ).** ගමනේ නොයෙදෙන නිසා කාලය ඉතිරි වීම, ණයකාඩ්පත් මගින් ගෙවීමේ හැකියාව, විශේෂඥ ගුරු සහය ලබා ගැනීමේ හැකියාව, විදෙස් පාඨමාලා හැදෑරීමේ හැකියාව (ලකුණු 2 )


**(Time saving as there is no travelling/Ability to pay using credit card/ Ability to get assistance from specialized teachers/Ability to follow foreign courses.)** **(**2 **Marks**)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371





































Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## කෙටි සටහන් පොත්













වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඔඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

